# ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනයේ ඉතිහාසය ගොඩනැගීමේදී අභිලේඛනයන්හි දායකත්වය

කවුඩාගම්මන රතනසාර හිමි[22]

---

බෞද්ධ සමාජය භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවණක් පිරිසෙන් සමන්විත වෙයි. ක්‍රි.පූ. තුන් වැනි ශතකයේදී ලංකාවේ බික්ෂුණී ශාසනය ඇරඹුණේ සංඝමිත්තා තෙරණියගේ ආගමනයෙනි. ලක්දිව භික්ෂු ශාසනය සම්බන්ධයෙන් තොරතුරු අධ්‍යයනයට මූලාශ්‍ර ගණනාවක් පැවතිය ද භික්ෂුණී ශාසනය සම්බන්ධයෙන් එසේ නොවේ. සාමය හා යුද්ධය පිළිබඳ කතාන්දරයට රාමුගත ව ඉතිහාසකරණයේ නියැලුණු පුරාතන ගත්කතුවරුන්ගේ මූලාශ්‍ර භික්ෂුණී ශාසනයේ ඉතිහාසය හැදෑරීමට ප්‍රාමාණික නොවේ. එ නිසාවෙන් පුරාවිද්‍යා මූලාශ්‍රය ද උපයුක්ත කර ගෙන භික්ෂුණී ශාසනයේ ඉතිහාසය ගොඩනැගීම සිදු කළ යුතු ය. දීපවංසය, මහාවංසය ආදී කෘතිවල යම් යම් තොරතුරු අන්තර්ගත වන අතර එම කරුණු තහවුරු කර ගැනීමට මෙන් ම නව තොරතුරු හෙළි කරගැනීමටත් අභිලේඛනයන්ගෙන් විශාල දායකත්වයක් ලද හැකි ය. ලංකාවේ හමු වී ඇති සෙල්ලිපි විශාල සංඛ්‍යාව අතරේ භික්ෂුණීන්වහන්සේ ගැන සඳහන් සෙල්ලිපි සංඛ්‍යාව ඉතා අල්ප ය. එයින් පුරුෂ පාර්ශ්වයට සාපේක්ෂ ව අඩු කාන්තා පිරිසක් සසුන්ගත වන්නට ඇතැයි අනුමිතියට එළඹිය හැකි ය. මිහින්තලේ, අනෛකුට්ටිකන්ද, බ්‍රාහ්මණයාගම, මහඇළගමුව, වැල් එල්ලුගොඩකන්ද, දාගම, අස්වැද්දුම, කොන්වැව, යටාල සහ දඹුල්ල ආදි ස්ථාන රැසකින් භික්ෂුණීන් පිළිබඳ සඳහන් ලිපි හමුව තිබේ. භික්ෂුණීන් වහන්සේ සිදු කළ පූජාවන්, ඔවුන්ගේ වාසස්ථාන, සමාජ තත්ත්වය මෙන්ම ඔවුන්ගේ ආගමික, සාමාජීය කාර්යයන් පිළිබඳ ව මෙම ලිපි වලින් කරුණු අනාවරණය වේ. පුරුෂාධිපත්‍යයෙන් යුතු ඉතිහාසකරණයක් ශ්‍රී ලංකාවේ දැකිය හැකි වෙයි. එවිට ඉතිහාසය තුළ කාන්තාවට හිමි වැදගත්කම සඳහන් කිරීමට ඔවුන් යොමු නොවීම විශ්මයක් ද නොවේ. ඒ පුරුෂ මූලික සංකල්පයන් නිසා නිරායාසයෙන් ම ඔහු අතින් එ වැනි තොරතුරු ගිලිහී යන්නට ඇත. සාහිත්‍ය මූලාශ්‍ර භික්ෂුණී ශාසනය පිළිබඳ ව අල්ප වශයෙන් කරුණු දක්වා ඇත. එ වැනි පසුබිමක් යටතේ භික්ෂුණී ශාසනය සම්බන්ධ තොරතුරු නිරාවරණයට සෙල්ලිපි ලබාදෙන පිටිවහල අතිමහත් ය.

ප්‍රමුඛ පද: භික්ෂුණී ශාසනය, මූලාශ්‍ර, සෙල්ලිපි

---

[22] පේරාදෙණිය විශ්වවිද්‍යාලය, kaudagammanarathana@gmail.com.